Reg No L07391

**Sri Lanka National Social Service Organization**

**ශ්‍රී ලංකා ජාතික සමාජ සේවා සංවිධානය**

Head Office
No. 11, PINWALAWATTA, PINWALA, PANADURA, SRI LANKA
Tel : 0094 382230495 / 072 - 9842312

Pro Office
Kanaththagoda South, Bandaragama
Tel - 038-2230495 / 076-999639
E-mail info@slnss.org / slnss.org1@gmail.com
Web www.slnss.org

Date

# "ජනතා හද ගැස්මෙන් ජාත්‍යන්තරය අවදි කරමු."





එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිහඬ සමාජ සේවක ඇගයීම් සහතිකය.

මා කළ මෙහෙවර
කළ හැකි කිසිවෙක්
වෙත්දැ යි බැස යන
හිරු නැගි පැනයක්....



හිමියනි මා හට
කළ හැකි තරමක්.........
කරනෙමි පැවසී
පොඩි මැටි පහනක්...





## 1.0 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික අර්බුදය නිසා ග්‍රාමීය ජනතාව වගේම, නාගරික ජනතාව දැඩි පීඩනයට පත් වී ඇත. එදිනෙදා වැඩ කරන (කුලී පදනම යටතේ) මිනිසුන්ගේ හදවතින් නැගෙන වේදනාව අප නිරන්තරයෙන් අත්විඳිමින් සිටී. දැනට ඇති වී තිබෙන මෙම ආර්ථික අර්බුදය සැලසුමක් මත හා දේශීය හා ජාත්‍යන්තර සමග සමීප සබඳතා ඉතා ඉක්මනින් ඇති කරගත් දේශීය ආර්ථිකය පරිහානියට ලක් නොවී කෙටි කලකින් හා අර්ධ කාලීන දීර්ඝ කාලීන වැඩ පිළිවෙලකට යා යුතු වේ. ඒමගින් රටේ ප්‍රධාන දැවෙන ප්‍රශ්නවලට පිළිතුර ලබා ගත හැකි යැයි අපගේ විශ්වාසය වේ. මෙම අර්බුදය ආරම්භවූයේ 2019 වර්ෂයේ සිට බව ප්‍රකාශ කලත් අපගේ හා ග්‍රාමීය ජනතාවගේ ජන අදහස් වලින් ඉස්මතු වූයේ අධික පොලිය මත ණය ලබාගැනීම හා දේශීය සම්පත් නිසි ප්‍රයෝජනයට නොගෙන ඉතා අඩු මුදලට විකුණා දැමීමය. එමගින් දල දේශීය අදායම පහල වැටීමෙන් හා අපනයනය ඉතා වේගයෙන් අඩු වීම විදේශ විනිමය පහල බැසීමට ප්‍රධාන හේතුවක් ලෙස අප දකිමි. දේශීය කර්මාන්ත කරුවන් දිරිගන්වා අපනයනය වැඩි කිරීමට පැවතුන හා පවතින රාජ්‍ය අපොහොසත් වීම නිසා අද මහා දැවැන්ත අර්බුදයකට පත්වී ඇත. ලෝකයේ ධනවත් වී ඇති හා සංවර්ධනය වෙමින් පවතින රටවල් වල රාජ්‍ය නොවන ආයතනය, කර්මාන්ත, රාජ්‍ය නොවන සංවිධානවල අදහස් හා මුල උපායක් ඒ ඒ රාජ්‍ය යන්ත්‍රය තුලින් ලබා ගැනීම එම රටවල් දියුණුවට ප්‍රධාන සාධකයක් වේ. අපගේ රටේ පවතින රාජ්‍ය නොවන සංවිධානය (ග්‍රාමීය මට්ටමෙන් වැඩකරන) අප වැනි සංවිධාන වෙතින් ඵලදායීව මේ වන තෙක් කිසිදු රාජ්‍ය පාලනයේදී අදහස් යෝජනා ලබා ගෙන නොමැත. දක්ෂ, බුද්ධිමත්, පරහිතකාමී සමාජ අත්දැකීම් ඇති බොහෝ පිරිසක් ඒකරාශී වී ගොඩනගාගෙන ඇති රාජ්‍ය නොවන සංවිධාන දෙස පැවතුන හා පවතින රාජ්‍යයන් බලන්නේ හා ක්‍රියා කරන්නේ ඉතාමත් අල්ප වශයෙන් බව මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි.

## 2.0 අරමුණු



අධික පිරිවැයක් දරමින් රාජ්‍ය නොවන ජාතික මහ ලේකම් කාර්යාලයේ වාර්ෂිකව සිදුවන්නේ කුමක්ද ? කිසිම රාජ්‍ය නොවන සංවිධානය මේ වනතෙක් ඇගයීමට ලක් කර නොමැති වාර්ෂික සැලසුම් වාර්තා පමණක් රඳවා තබා ගනිමින් ඒ මත පදනම් කරගෙන ගමන් කරන රාජ්‍ය නොවන ජාතික ලේකම් කාර්යාලයේ අධීක්ෂණ ව්‍යුහය වහා වෙනස් විය යුතු අතර එය ජාතික ආර්ථිකයට වඩාත් පලදායක වන අන්දමට රාජ්‍ය නොවන සංවිධාන දිරි ගන්වා දේශීය ආර්ථිකයට නව ජවයක් ලබා දීමට වහා ප්‍රතිසංවිධානගත කල යුතුය. මේ පිළිබඳව වඩාත් ඵලදායක ලෙස මෙහෙයවීමට හා එම රාජ්‍ය නොවන සංවිධාන වලට (ක්‍රියාකාරී) දේශීය හා ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වා රට තුලට විදේශ විනිමය ලබා ගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් ඇරඹිය යුතුය. මෙම වැඩපිළිවෙල කඩිනමින් ඉටු කිරීම සඳහා වන කාල රාමු යෝජනාව පිළිබඳ අවධානය යොමු කරවීම අපේක්ෂාව වේ.

## 3.0 ශ්‍රී ලංකා ජාතික සමාජ සේවා සංවිධානය L 07301





1997-10-01 දින පලාත් මට්ටමේ ලියාපදිංචි වී 2000-03-20 රාජ්‍ය නොවන ජාතික මහ ලේකම් කාර්යාලයේ ලියාපදිංචිව ඇති ශ්‍රී ලංකාවේ ඇති එකම රාජ්‍ය නොවන සංවිධානයකි. එයට හේතුව 1980 අංක 30 දරණ පනත රජය විසින් සම්මත කරගත් පසු 1998 සංශෝධනය කරමින් අමාත්‍යංශයට ගොනු කරන ලද අතර 1998 පසු කිසිදු රාජ්‍ය නොවන ආයතනයකට ශ්‍රී ලංකා ජාතික යන නාමය නොවිය යුතුය. ඒ අනුව අපගේ සංවිධානය ශ්‍රී ලංකා ජාතික යන නාමයෙන් භාවිතයට ලැබීම අප ලද ජයග්‍රහණයකි. අප සංවිධානය පුරා වසර විසි පහකට ආසන්න (25) කාලයක් තිස්සේ අපේ රටේ ජාතික ආර්ථිකයට සුවිශාල මෙහෙවරක් සිදුකර ඇති අතර අදටත් එය නොවෙනස්ව පවතී.

රටක ආර්ථිකය ශක්තිමත් වන්නේ රටේ ජනතාව බුද්ධිමත් වුවොත් පමණි. එම නිසා මාගේ නායකත්වය පවත්වාගෙන යන මෙම සංවිධානය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන දරු පරපුර බුද්ධිමත් සමාජයට අවතීර්ණ කිරීම අපගේ ප්‍රධාන ව්‍යාපෘතිය වේ.

1. **සිසු ණැන උද්‍යාන**
2. **සිසු ණැන දිවියට අත්වැලක්**
3. **ශ්‍රී ලාංකික අධ්‍යාපනික තාරුණ්‍යය**

**3.1 සිසු ණැන උද්‍යාන**








ශ්‍රී ලංකාවේ පවතින අධ්‍යාපන රටාව පිළිබඳව බහුතර ජනතාවක් පිළිගන්නේ නැති උනත් පාලකයන්ගේ අවශ්‍යතාවය හා ඔවුන්ගේ ජනප්‍රියභාවයට හේතු පදනම් කරගෙන අධ්‍යාපන වෙනස්කම් සිදු කරන ලදී. එය දියුණු වෙමින් පවතින රටක බරපතල ගැටලුවකි.

පාසල් දරුවෙක් ආම්භක වසර වන 01 වන ශ්‍රේණිය තුල සිට පස්වැනි ශ්‍රේණිය දක්වා දරුවා අධ්‍යාපනයට පෙර මග සලසා ගැනීම කර ගත යුතු අතර අප රටේ එම මතය බැහැර කර ළමා මනස විනාශ කර අධ්‍යාපනය ලබා දීම වස් පස්වන ශ්‍රේණි කඩ ඉම් විභාගය කියා දරුවා පමණක් නොව දෙමාපියන්ද දවසේ වැඩි කාලයක් මහපාරේ සිටීම අනාගත දැක්මට සුවිශාල හානියකි. එම නිසා අප විසින් හය වන ශ්‍රේණිය සිට 12 වන ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන දරුවන් වෙත පහත සඳහන් අධ්‍යාපන උපකරණ ලබා දීමෙන් හා දරු සමාජයෙන් අධ්‍යාපනයට යොමු වී බුද්ධිමත් තරුණ සමාජයක් කරා පියමන් තබන වැඩදායක පුද්ගලයෙකු බවට පත් කිරීම මෙමගින් අරමුණු වේ. දරු මනස නිසි අධ්‍යාපනයට යොමු කිරීම උදෙසා "දැයේ දරුවන්ගේ අනාගතය කොයිබටද" යන මැයෙන් අධ්‍යාපනික දේශනයද පවත්වනු ලැබේ.

- **පාසල් සපත්තු**
- **පිටු 200 පොත් දුසිමක්**
- **CR පොත් 06 (11 ශ්‍රේණියට ලබාදීම)**
- **පාසල් බෑග් එකක්**
- **පෑන් පැන්සල්**



## 3.2 සිසු ණැන දිවියට අත්වැලක්



පුවත් පත් වාර්තාව

මත් ව්‍යසනයෙන් ලක් දෙරණේ දරු දැරියන් බේරා ගැනීම මාගේ මූලික ඉලක්කයයි

ලාංකික ජන සමාජය තුල වඩාත් කථා බහට ලක්වන රාජ්‍ය නොවන සංවිධාන වලින් නොකරන දේවල් අප සංවිධානය මගින් ක්‍රියාත්මක කිරීමේත් ග්‍රාමීය ජනතාව පමණක් නොව සමස්ථ සමාජය අඳුරු ලෝකයට ඇද දමමින් ගෙන යන මත්ද්‍රව්‍ය ව්‍යාපාරය තුලින් පාසල් දරුවන් විශාල ප්‍රමාණයක් ඒවාට ගොදුරු වී ඇත.

නාගරික, අර්ධ නාගරික ග්‍රාමීය ජනතාවගේ වැඩි කොටසට මෙකී මත්ද්‍රව්‍ය වලට යොමු තම පවුල් ජීවිතය විනාශ වී ගිය සංඛ්‍යාව සමානයි දිවි නසා ගැනීම, අප විසින් මෙවැනි පවුල් අගාදයට යාමට මත්තෙන් අප සංවිධානයේ ගරු සභාපතිතුමා මනා බුද්ධිය තුලින් ඒම පවුල් නැවත යථා තත්ත්වයට ගැනීමෙන් එම පවුල් රටට හා සමාජයට බරක් නොවන අන්දමින් ජීවත් වන්නට අවශ්‍ය වටපිටාව සකසා දීම හා එම පවුල්වල දරුවන්ට නිසි අධ්‍යාපනයට අවශ්‍ය පූර්ණ දායකත්වය ලබා දී ජීවිත සුරක්ෂිතතාව සිසු ණැන දිවියට අත්වැලක් යටතේ ක්‍රියාත්මක වෙමින් පවතී.

ඒ සමග මත්ද්‍රව්‍ය වලට යොමු වී තිබෙන පාසල් දරුවන් අප සංවිධානය හරහා පූර්ණ වගකීම ගෙන අධ්‍යාපනික කටයුතු ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී.

සමස්ත ලෝක සමාජයේ අනාගතය බාරව ඇත්තේ තරුණ පරම්පරාවටය. ඒබ ව මුළු ලෝකයම පිළිගෙන පමණක් නොව එය අවශ්‍ය බුද්ධිමය යාන්ත්‍රණයක් ඔවුන් පසු පස ගමන් කරවන්නට සූදානම් කර ඇත. අද වන විට සමහර රටවල් ඉතා සීඝ්‍රයෙන් දියුණු වෙලා තිබෙන්නේ තරුණ බුද්ධිමත් නිර්මාණශීලී ලෝක ආර්ථිකයට ගැළපෙන අවශ්‍ය යෝජනා අදහස් ලබා දීමෙන් ආර්ථිකය ශක්තිමත් කිරීම නිසාය.

## 3.3 ශ්‍රී ලාංකික අධ්‍යාපනික තාරුණ්‍යය



පානදුර ශාන්ත ජෝශප් විද්‍යාලය - අධ්‍යාපනික දේශනය




අප සංවිධානය මගින් අධ්‍යාපනය අවසන් කර ඇති දරුවන්ට උසස් අධ්‍යාපන හා වෘත්තීය පාඨමාලා පිළිබඳව ඉතා අවධාරණයෙන් දැනුවත් කර එම පාඨමාලා වලට යොමු කර ඔවුන්ගේ අධ්‍යාපන දැනුමට සරිලන වෘත්තීය පුහුණු පාඨමාලා ලබාදීම සහ ඒවාට අවශ්‍ය මූලික පහසුකම් ලබාදී බුද්ධිමත් සමාජයකට එකතු කිරීම අපගේ ප්‍රධාන අරමුණ වේ. එවැනි තරුණයන් රාජ්‍ය හා පුද්ගලික ආයතන රැකියාවලට යොමු කර පවුල් ආර්ථිකයද ශක්තිමත් කර ගැනීමත් සමගම ජාතික ආර්ථිකයට විශාල ශක්තියක් ලබාදීම තුළින් තරුණයාගේ සිතුම් පැතුම් ගලා යාමේදී ඒ අපතේ නොයා නිසි කලමනාකරණය කර සමාජ ගත කර සැබෑ ජාතික පුරවැසයකු බවට පත් කරලීමේ උදාර කාර්යය මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ.

ශ්‍රී ලංකා ජාතික සමාජ සේවා සංවිධානය යන නාමයේ නියම අර්ථය මේ රටේ ජනතාව භුක්ති විඳිමින් ලබා ගන්නා සාරය නිසි ලෙස යොමු කිරීමේ වගකීම පවතින රාජ්‍ය පාලනය තුල සිදුවිය යුතුය. නමුත් එය එසේ නොවී පුද්ගල ජනප්‍රියතාව පෙර දැරිකර ගෙන එන ව්‍යාපෘතීන් වලට සුවිශාල පිරිවැයක් දරමින් රටටත් සමාජයටත් විශාල බරක් ගෙන ඒමෙන් සිදු වන්නේ තවත් පරිහානියට ලක් කිරීමයි.

අප සංවිධානය ශ්‍රී ලංකාවේ පිහිටි යෞවන සමාජ, ක්‍රීඩා සමාජ එකට එක්වී පලදායී සමාජ සේවාවක් ලබාදී නිදහස් නිවහල් බුද්ධිමත් තරුණයන් බිහි කිරීමේ ව්‍යාපෘති වල ක්‍රියාත්මක කරමින් පවතී.

## 4.0 සිසුණෑන උදාන අධ්‍යාපන ව්‍යාපෘති ආධාර



වසර විසිපහකට ආසන්න කාලයක් තිස්සේ දේශීය හා විදේශීය දානපතීන් සමග එකතු වී හා ජාත්‍යන්තර එක් සංවිධානයකින් ඉතා සුළු ආධාරයන් පමණක් ලබා ගනිමින් මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක කරමින් ඉදිරියට ගෙන යන ලදි.

2019 සිට මේ දක්වා අප රට  තුළ ඇති වුන බරපතල හා ලෝක වසංගතය නිසා රටේ ආර්ථිකයට පමණක් නොව දේශීය ව්‍යාපාරිකයන් දැඩි සේ හානි සිදු වී ඇත.  එම හානිය නිසා අපගේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට තරමක් දුරට අඩුවිය. මෙවන් අවස්ථාවක රාජ්‍ය නොවන ජාතික මහ ලේකම් කාර්යාල වගකීම මෙවැනි උතුම් හා රටට ජනතාවට වැදගත් ව්‍යාපෘති වලට අතහිත දීමයි.  2019 සිට ඇතිවුණ කොවිඩ් වසංගතය හා ඊට වඩා අප රටේ විදේශ විනිමය නැතිවීම තුල අප රටේ ව්‍යාපාරික ප්‍රජාව වගේ එදිනෙදා කුලී වැඩ කරන අසරණ ජනතාව තවත් අසරණ භාවයට පත්වීම.

## 5.0 යෝජනාව

* <u>ජනතා හද ගැස්ම ජාත්‍යන්තරය අවදි කරමු.</u>

අද අප රට ඉතා බරපතල විදේශ විනිමය ගැටලුවකට මුහුණ පා ඇති අතර එම ගැටලු නිසා සමස්ථ ජනතාව දැඩි කලකිරීමෙන් හා ක්‍රෝධයකින් සිටින බව අප කළ සමීක්ෂණයේදී අණාවරණය විය.  මෙම විදේශ විනිමය අර්බුදය නිසා පහත සඳහන් අර්බුදකාරි තත්ත්වයට මුළු රටම පත්වී හමාරයි.

1. **විදුලිය කපා හැරීම**
2. **ඉන්ධන ක්ෂය වීම**
3. **ගෑස් ක්ෂය වීම**
4. **බෙහෙත් නැති වීම**
5. **අධ්‍යාපනික උපකරණ ඌන වීම**
6. **බඩු මිල ඉහල යාම (අසාමාන්‍ය උද්ධමනය) සහ ලබා ගැනීමේ දුෂ්කරතාවය**
7. **රැකියා අහිමි වීම.**

වසර තිහකට ආසන්න කාලයක් මේ රටේ යුද්ධය පැවති කාලයේදීවත් මෙවන් අර්බුදයකට ලක්වී නොමැත. මිනිසාගේ පැවැත්මට අවශ්‍ය ප්‍රධාන අවශ්‍යතාව නැතිවීම සහ හිඟවීම රටකට හා ජනතාවට දරාගත නොහැකි පීඩනයක් ලැබී ඇත. මේ අවස්ථාවේදී දරුණු ආර්ථික අර්බුදයට ප්‍රධාන වූ කරුණු සොය සොයා කම්ටු පත් කිරීමෙන් වන්නේ කාලය විනාශ වීම සහ තවත් දරුණු අගාධයකට වැටීමයි. එම නිසා සියලුම ශ්‍රී ලාංකික ජන සමාජයට වගකියන රාජ්‍ය පාලනයට ශක්තියක් වීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියා කල යුත්තේ එය සමස්ථ රාජ්‍ය නොවන සංවිධාන (ග්‍රාමීය මට්ටමෙන් නිහඬ සේවාවක් කරන) එකමුතු කර ඉතා වේගවත් වැඩපිළිවෙලකට යා යුතුය. ඒ සඳහා අප සංවිධානය පහත යෝජනා ඉදිරිපත් කරමි.

1. **අතිගරු ජනාධිපතිතුමාගේ පූර්ණ සම්බන්ධීකරණය**
2. **ශ්‍රී ලංකාවේ සිටින සියළුම තානාපති තුමන්ලා සම්බන්ධීකරණය කිරීම හා නිසි සහයෝගය ලබා ගැනීම.**
3. **විදේශ රටවල් වල සිටින සියලුම ශ්‍රී ලාංකික පිරිස මුණගැසීම හා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීම උදෙසා ප්‍රධාන විදේශ සංචාරයට අවශ්‍ය පහසුකම් ලබා ගැනීම**
4. **රාජ්‍ය නොවන සංවිධාන හරහා ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීම හා රාජ්‍ය පාලනය කෙරෙහි ඇති අවිශ්වාසය බිඳ දමා විශ්වාසය තහවුරු කර ගැනීම තුළින් විදේශ විනිමය රට තුලට ගෙන්වා ගැනීමට කටයුතු කිරීම.**

දැනට පවතින තත්ත්වය මත ලෝක ප්‍රජාව ශ්‍රී ලංකාව කෙරෙහි දැඩි අනුකම්පාවට පත්වී ඇත. එබැවින් එකී සානුකම්පිත භාවය නිසි ප්‍රයෝජනයට ගෙන ඔහුගේ මනස අවධි කිරීමට පූර්ණ වැඩපිළිවෙලක් තුළින් විදේශ ආධාර ලබා ගැනීමට හැකි බව අපගේ විශ්වාසයයි. එමගින් ශ්‍රී ලංකාවේ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කළ හැකි බවත් ඒ සඳහා පහත සඳහන් රටවල් වල තානාපතිතුමන්ලා මුණ ගැසී ඔවුන්ගේ උපදෙස්, යෝජනා හා දැනුම ලබා ගෙන ඒ ඒ රටවල් වල විදේශ සංචාරය කර අවශ්‍ය කඩිනම් ආධාර ලබාගැනීමට කටයුතු කළ යුතුය. මෙය රාජ්‍ය නොවන සංවිධාන වල පූර්ණ මැදිහත්වීමකින් කළ යුතු අතර රාජ්‍ය අනුග්‍රහය ලැබිය යුතුය.

1. **ඇමරිකාව**
2. **කැනඩාව**
3. **යුරෝපා රාජ්‍යය (සියලුම රටවල්)**
4. **ආසියාතික රටවල්**
5. **බ්‍රිතාන්‍යය**
6. **ස්විස්ටර්ලන්තය**
7. **ජපානය**

අපගේ කඩිනම් ව්‍යාපෘතිය හරහා දැනට ලංකාවේ අධ්‍යාපනය ලබන දරුවන්ට අවශ්‍ය අධ්‍යාපන උපකරණ හා පොත් පත් හා පෝෂණ අතිරේක නොමැති බවත් ඒ සඳහා මෙම ව්‍යාපෘතිය මගින් ආධාර අපේක්ෂා කරමි. අප ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජනතාවගේ බහුතර පිරිසක් කුලී වැඩ කරමින් ජීවත් වන බැවින් අද තිබෙන බඩු මිල අනුව පෝෂ්‍යදායක ආහාර වේලක් තම දරුවන් හට ලබා දීමට නොහැක. එම නිසා ළමා මන්දපෝෂණය සීග්‍රයෙන් වැඩි වෙමින් පවතී.

ශ්‍රී ලංකාවේ දුෂ්කර පලාත් වන කළුතර, රත්නපුර, ගාල්ල, හම්බන්තොට, බදුල්ල, මොනරාගල, මුලතිව්, වව්නියා වැනි දිස්ත්‍රික්ක වල අප කළ සමීක්ෂණයේදී පහත සඳහන් ද්‍රව්‍යමය ආධාර කඩිනමින් අවශ්‍ය බව ඉතා සංවේදීව මතක් කරමි.

1. **පාසල් සපත්තු (DSI)**
2. **පාසල් බෑග්**
3. **පිටු 200 පොත් දුසිම්**
4. **CR පොත්**
5. **පෑන් පැන්සල්**
6. **පරිගණක යන්ත්‍ර (පරිගණක පුහුණු පාඨමාලා සඳහා) (පාසල්, යෞවන සමාජ, ක්‍රීඩා, සමගි, ළමා සමාජ)**
7. **අත්‍යවශ්‍ය බෙහෙත් ලබා ගැනීම**
8. **අත්‍යවශ්‍ය කිරිපිටි ලබා ගැනීම**
9. **පෝෂ්‍යදායක ආහාර ලබා ගැනීම**

ඉහත සඳහන් ද්‍රව්‍යමය දෑ දැනටමත් ලංකාව තුළ බරපතල ලෙස හිඟ වීම සහ අධික මිල ඉහළ යාම නිසා ළමා පරපුර මන්දපෝෂණයෙන් පෙළීමේ ඉහල ප්‍රතිශතයන්ට පත්වීම සිදුවේ. අධ්‍යාපනයට සමගාමීව බෙහෙත් සහ පෝෂ්‍යදායී ආහාර දරුවන්ට අවශ්‍ය ලෝක සෞඛ්‍ය සංවිධාන වීම පිළිගත් ප්‍රධාන කරුණක් ලෙස දැක්වේ.

සමස්ථ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා ජනරජයේ මෙරට සිටින විදේශ රාජ්‍ය නියෝජිත තානාපතිතුමන්ලා හා ඒ ඒ රටවල් නියෝජනය කරන අපගේ තානාපතිතුමන්ලා සහ නිලධාරී සියලුදෙනාගේ පූර්ණ දායකත්වය ලබා දෙන්නේ නම් ශ්‍රී ලංකා ජන සමාජය බුද්ධිමත් ශිෂ්ඨ සම්පන්න නිරෝගිමත් දරු පරපුරක් බිහිකිරීමේ මහඟු පුන්‍යභාවයට පත්වීම නොඅනුමානය. එම නිසා මෙම ව්‍යාපෘතිය ලෝකවාසී සියලු දෙනාගේ පූර්ණ ආශිර්වාදය සහ සහයෝගය මේ දුෂ්කර මොහොතේ ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

ස්තුතියි

SRI LANKA NATIONAL SOCIAL SERVICE ORGANIZATION
No: 11, Pinwala Wattha,
Pinwala Panadura,
Sri Lanka.
Reg No: L 07301

..........................................

ජයසිංහ වීරක්කොඩි (වි. සම්මානලාභී එ.ජා.ස.)
සභාපති/ජාතික අධ්‍යාපන. දේශක
ශ්‍රී ලාංකික අධ්‍යාපනික තාරුණ්‍යයේ ජාතික නායක
සිසු ඥාන උදාන නිර්මාතෘ

JAYASINGHE WEERAKKODI
(Excellent V AWARADS)
Chairman / Director National Education
Youth of Education Sri Lanka National Leader
Sri Lanka National Social Service Organization